# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත

---

[සහතිකය සටහන් කළේ 1991 සැප්තැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 සැප්තැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල . රු. 2.40 යි. තැපැල් ගාස්තුව : රු. 1.55 යි.

# 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත

[සහතිකය සටහන් කළේ 1991 සැප්තැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 79/90

බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස ජාතික ගමනාගමන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාද; රාජ්‍ය අංශයෙහි බස් රථ මගින් මගී ප්‍රවාහනය ප්‍රතිසංවිධානය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහාද; ඇතැම් මගී ප්‍රවාහන සේවාවන්ට මූල්‍යාධාර සැපයීමට විධිවිධාන සැලැස්වීම සඳහාද; 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනත ඉවත් කිරීම සඳහාද; (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහාද වූ පනතකි.

පූර්විකාව.

(අ) බස් රථ මගින් මගී ප්‍රවාහනයට අදාළ සේවාවන්හි අයිතිය සහ ඒවා මෙහෙයවීම සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශය සතු කළ යුතු වීමත් එවැනි සේවාවන් සලසන කිසියම් මණ්ඩලයක අයිතිය හෝ පාලනය සම්පූර්ණයෙන්ම, හෝ කොටසක් වශයෙන් හෝ අත්කර ගැනීම, කිසිදු රාජ්‍ය ආයතනයක්, පළාත් සභාවක්, හෝ පළාත් පාලන ආයතනයක් හෝ රජය හෝ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් කොටස් දරනු ලබන යම් සංස්ථාවක් අත්කර නොගත යුතුවීමත්, එවැනි යම් මණ්ඩලයක් කෙරෙහි යම් සම්බන්ධතාවක් දැනට රජයට අයත්ව පවත්නා හෝ රජය විසින් දරනු ලබන හෝ අවස්ථාවක, හැකිතාක් ඉක්මනින් එම සම්බන්ධතාව රජය විසින් අත්හරිනු ලැබිය යුතු වීමත්;

(ආ) මහජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණයට සහ තත්ත්වයට බස් රථ මගින් මගී ප්‍රවාහනයට අදාළ සේවාවන් දියුණු තත්ත්වයට නංවාලීම සහ එම සේවාවන් ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම සාධාරණ ලෙස ව්‍යාප්ත කිරීමත්;

(ඇ) සමාජීය වශයෙන් අවශ්‍ය එහෙත් ලාභ නොලබන මාර්ගවල, බස් රථ මගින් මගී ප්‍රවාහනයට අදාළ ප්‍රමාණවත් සේවාවන් මෙහෙයවීම සඳහා විධිවිධාන සැලැස්වීමත්;

(ඈ) එම සේවාවන් සලසන තැනැත්තන් අතර, යහපත් තරගකාරීත්වයක් පවත්නා බවට වගබලා ගැනීමත්;

ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන හෙයින්;

2—ඩී013970—8,230 (91/07)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවීම, එහි බලතල හා කර්තව්‍ය

ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

2. (1) (මේ පනතෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ගමනාගමන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වූ ද, 3 වන වගන්තිය යටතේ තත් කාලයෙහි කොමිෂන් සභාවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද, කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, කොමිෂන් සභාව විසින් එහි සංස්ථා නාමයෙන් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්.

3. (1) කොමිෂන් සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් එනම් :–

(i) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට අඩු නොවන නිලයක වූ, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ii) ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නොවන නිලයක වූ, ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නොවන නිලයක වූ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ; සහ

(ඈ) ප්‍රවාහන, ආර්ථික විද්‍යා, වෛද්‍ය විද්‍යා, පරිපාලන හෝ ඉංජිනේරු ක්ෂේත්‍රවල පළපුරුද්දක් හෝ සුදුසුකම් ඇත්තාවූ හෝ හැකියාවක් දක්වා ඇත්තා වූ හෝ තැනැත්තන් අතුරින් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයන් පස් දෙනකුගෙන්,

මේ ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු මෙහි මින් මතු "පත් කරන ලද සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු වේ නම් හෝ එලෙස පත් වේ නම්, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකු අසනීප වීමේ, දුබලතාවකට පත්වීමේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට ඔහුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන කෙරෙහි සැලකිලිමත් ව, ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු කිසිම හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකුට, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලද ලිපියක් මගින් කොමිෂන් සභාවෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාවේ පත් කරන ලද සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය :

එසේ වුව ද, ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරන හෝ සාමාජිකයකු වෙනුවට පත් කරන ලද කොමිෂන් සභාවේ සාමාජිකයකු, ඔහු කලින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කරතහොත් හෝ මිස, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(7) කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන කොමිෂන් සභාවේ පත් කරන ලද යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(8) (අ) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(ආ) සභාපතිවරයා විසින්, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) අමාත්‍යවරයා විසින්, කිසිම හේතුවක් නොදක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, එම ඉවත් කිරීම කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(ඈ) මේ උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන කාල සීමාව විය යුතු ය.

(9) මේ උපවගන්තිය මගින් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලය හැර, මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති කොමිෂන් සභාවේ බල තල කිසිවක් හෝ බලතල සියල්ල, කොමිෂන් සභාව විසින් සභාපතිවරයා වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

**සභාපතිවරයා සහ රැස්වීම් කටයුතු පවත්වා ගෙන යාම**

4. (1) සභාපතිවරයා විසින්, තමා පැමිණ සිටින කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, රැස්වීම සඳහා ඔවුන් අතුරින් සභාපතිවරයකු තෝරා ගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ කවර හෝ රැස්වීමක දී, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ පනතේ වෙනත් යම් විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද, යම් නියෝගයකට යටත් ව කොමිෂන් සභාව විසින්, එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම විධිමත් කරගනු ලැබිය හැකි ය.

**පුරප්පාඩුවක් තිබුණ ද කොමිෂන් සභාවට කටයුතු කළ හැකි බව.**

5. කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයන් අතුරින් යම් සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් හෝ තිබීමේ හේතුව නිසාම පමණක්, කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

**කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.**

6. කොමිෂන් සභාවේ සාමාජිකයන් සියලු දෙනාටම හෝ එයින් යම් සාමාජිකයකුට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකි ය.

**කොමිෂන් සභාවේ මුද්‍රාව**

7. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(ඊ) කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කොමිෂන් සභාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට දැකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනා ම ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

8. කොමිෂන් සභාවේ කර්තව්‍ය, බස් රථ මගින් මගී ප්‍රවාහන සේවාවන්ට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිල්ල ඇතිව— කොමිෂන් සභාවේ කර්තව්‍ය.

(අ) මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස, පිළිගත හැකි තත්ත්වයකින් යුත් බස් රථ සේවා පවතින්නේ ද යන වග අවලෝකනය කිරීම සහ එම සේවා පවත්වා ගෙන යා යුතු අවම මට්ටම් නිර්ණය කිරීම;

(ආ) වෙන් වෙන් ගාස්තු මත මගීන් ගෙන යාම සඳහා බස් රථයක් යොදා ගැනීමට බලය දෙන බස් රථ ධාවන අවසර පත්‍රයක් හෝ වෙනත් අධිකාරයක්, බලයලත් තැනැත්තකු විසින් නිකුත් කිරීම හෝ අලුත් කිරීම කළ හැකි වන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි සඳහන් කිරීම;

(ඇ) මේ පනත යටතේ හෝ බලයලත් තැනැත්තන් විසින් හෝ අවසර පත්‍ර දරන්නන් වෙත නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවල කොන්දේසිවලට අනුකූලව ඔවුන් ගේ ක්‍රියා කිරීම අවලෝකනය කිරීම සහ යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව එලෙස ක්‍රියා කිරීම ක්‍රියාත්මක කිරීම;

(ඈ) බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරනු ලැබිය හැකි මගී සේවා අවසර පත්‍රවල ආකෘතිය නියම කිරීම;

(ඉ) බලයලත් තැනැත්තකු විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා අය කරනු ලැබිය යුතු ගාස්තු නිශ්චය කිරීම;

(ඊ) මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්කරුවකු විසින් බලයලත් තැනැත්තකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු, වාහන යෝග්‍යතාවට, මගීන් ගෙන යාමේ ධාරිතාවට හා රියදුරු යෝග්‍යතාවට අදාළ ලේඛන සඳහන් කිරීම;

(උ) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි යම් වාර වාර්තා සහ තොරතුරු කොමිෂන් සභාව වෙත සපයන ලෙස බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර දරන්නන්ට නියම කිරීම;

(ඌ) (i) තැපැල් ගෙනයාම; සහ
(ii) පාසල් ළමයින් සඳහා සහ විශ්වවිද්‍යාලවල, කාර්මික ආයතනවල සහ ඒ හා සමාන වෙනත් ආයතනවල ශිෂ්‍යයන් සඳහා අනුග්‍රාහක ගාස්තු මත පාසල් සේවා සැලැස්වීම.

ඇතුළුව, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ ආයතනවලට අවශ්‍ය බස්රථ සේවා සම්බන්ධයෙන් ඒ දෙපාර්තමේන්තු, ආයතන සහ බලයලත් තැනැත්තන් සමග සම්බන්ධතා ඇති කර ගැනීම;

(එ) නිශ්චිත ප්‍රදේශයෙහි බස්රථ සේවා සඳහා මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම;

(ඒ) බස් සේවා සැපයීම සඳහා තරගකාරී ඉල්ලුම් සලකා බැලීමෙන් පසුව, තැනැත්තන් සමග ගිවිසුම්වලට ඇතුළත් වීමෙන් ලාභ නොලබන මාර්ගවල බස් රථ සේවා සැලසෙන බවට වගබලා ගැනීම සහ අවශ්‍ය විටක, එවැනි සේවා සලසන තැනැත්තන්ට මූල්‍යාධාර සැලසීම් සහතික කිරීම සහ සපයනු ලබන සේවාවල ස්වභාවය කෙරෙහි සැලකිලිමත් ව, එම තැනැත්තන් විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු නිශ්චය කිරීම;

(ඔ) අන්තර් පළාත් බස්රථ සේවා සැලසීම හා ඒ සම්බන්ධයෙන් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා යම් තැනැත්තකු සමග ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඕ) බලයලත් තැනැත්තන්ට කළමනාකරණ විශේෂඥතා හා සහාය සහ බස්රථ සේවා සැලසීමට අදාළව බලයලත් තැනැත්තන්ගේ කර්තව්‍ය නිසි පරිද්දෙන් ඉටු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය විය හැකි වෙනත් යම් සහාය හෝ උපදෙස් සැපයීම;

(ක) බස් රථවල භාණ්ඩ ගෙන යාම සඳහා කටයුතු පිළියෙල කිරීම

විය යුතු ය.

කොමිෂන් සභාවේ බලතල

9. කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය:—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, ඇරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) කොමිෂන් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කිරීම;

(ඇ) කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරන ලද නිලධරයන්ගේ හා සේවකයන්ගේ කෞශල්‍යය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා කවර හෝ දෙයක් කිරීම;

(ඈ) කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම;

(ඉ) කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් සඳහා සුභ සාධක විනෝදාංශ පහසුකම් සැපයීම;

(ඊ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට කෙළින්ම හෝ තත්කාර්යය සඳහා බලය දී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු හෝ මගින් එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම;

(උ) කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය, හැසිරීම සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, ඒ නිලධරයන්ට හා සේවකයන්ට අදාළ රීති සෑදීම;

(ඌ) මගී සේවා අවසර පත්‍ර දරන්නන් විසින්, බස් රථ සේවා සැලසීමට අදාළ ස්වකීය කටයුතු නිසි පරිදි ඉටු කළ හැකි වනු පිණිස ඒ අවසර පත්‍ර දරන්නන්ට ඉංජිනේරු, තාක්ෂණික, නීතිමය, වෛද්‍ය සහ මූල්‍ය ආධාර සහ උපදෙස් සැපයීම;

(එ) කොමිෂන් සභාවේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා, කොමිෂන් සභාවේ මතය අනුව අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

කොමිෂන් සභාව සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල.

10. (1) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වූ සාමාන්‍ය විධාන දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක ඔහු වෙත සපයන ලෙස ඔහු විසින්, ලියවිල්ලක් මගින් කොමිෂන් සභාවට කලින් කල විධාන කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින්, ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

විධාන දීමෙහි ලා කොමිෂන් සභාව සතු බලතල.

11. (1) බස් රථ සේවා සැලසීමට අදාළව බලයලත් තැනැත්තන්ගේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ ද, ඒ තැනැත්තන් විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සඳහන් කරන ලද ප්‍රමිති හා කොන්දේසිවලට අනුකූලව ඒ තැනැත්තන් විසින් ක්‍රියා කිරීම සහතික කිරීමේ ද එම බලයලත් තැනැත්තන් විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කරනු ලැබීමේදී කාර්යය සඳහා සහ ඒ බලයලත් තැනැත්තන්ගේ ප්‍රතිපත්තිය විෂයයෙහි සාමාන්‍ය පාලනයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාවට පෙනීයන යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන කොමිෂන් සභාව විසින් යම් බලයලත් තැනැත්තකු වෙත දෙනු ලැබිය හැකි අතර, එසේ විධාන ලැබූ සෑම බලයලත් තැනැත්තකු විසින් ම, ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) සෑම බලයලත් තැනැත්තකු ම ස්වකීය කටයුතු සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමෙහි ලා පහසුකම් කොමිෂන් සභාවට සලසා දිය යුතු අතර ඒ කටයුතු සම්බන්ධයෙන් කොමිෂන් සභාව

විසින් නියම කරනු ලැබිය හැකි යම් වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු ද කොමිෂන් සභාව වෙත සැපයිය යුතු ය. තවද, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් ආකාරයකින් හා යම් වේලාවක දී එසේ සපයන ලද තොරතුරු සත්‍යයනය කිරීමේ පහසුකම්ද කොමිෂන් සභාවට සලසා දිය යුතු ය.

කොමිෂන් සභාව සඳහා, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම

12. (1) කොමිෂන් සභාවේ කාර්ය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ ද, යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ මහජන කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අනිවාර්යයෙන් අත්කර ගෙන, කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව සඳහා, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක්, කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබිය යුතු ය.

රජයේ දේපළ කොමිෂන් සභාවට පැවරිය හැකි බව

13. (1) කොමිෂන් සභාවේ කාර්ය සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් හෝ කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ ආඥාපනතේ විධිවිධාන, කොමිෂන් සභාවට ඒ දේපළ විශේෂයෙන් ප්‍රදානය කිරීම හෝ බදුදීම හෝ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ කාර්ය සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, ඒ දේපළෙහි සන්තකය සහ පරිහරණය කොමිෂන් සභාව වෙත පවරා සතු කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

14. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව එවැනිම කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා තාවකාලික වශයෙන් පත් කිරීම හෝ එවැනි ම කැමැත්ත ඇති ව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) යම් රජයේ නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක—

(අ) ඔහු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී රාජ්‍ය සේව යෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම්—

(i) ඔහු කොමිෂන් සභාවේ සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති අතරතුර, රාජ්‍ය ප්‍රතිපත්තිය මත වැටුප් රහිතව දෙන ලද නිවාඩු පිට රාජ්‍ය සේවයේ රාජකාරිය සඳහා නොපැමිණි ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ව්‍යවස්ථා සංග්‍රහයේ 10(1) වන වගන්තිය ඔහුට අදාළ විය යුතු ය ; තවද

(ii) ඔහු කොමිෂන් සභාවේ සේවයෙහි නියුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් ම සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චිය කරනු ලබන රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවනු ලැබිය යුතු වැටුපෙන් සියයට විසි පහක් නොඉක්මවන යම් මුදලක් කොමිෂන් සභාවේ අරමුදල්වලින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ඔහු සම්බන්ධ යෙන් මහා භාණ්ඩාගාරයට ගෙවනු ලැබිය යුතුය ; තව ද

[(ආ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් ඔහු පත් කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකුව සිටියේ නම්, කොමිෂන් සභාවට ඔහු විසින් කරනු ලබන සේවය, ඒ ආඥාපනතේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඒ ආඥාපනත යටතේ ගෙවීමට ඔහු යටත් වන දායක මුදල ඔහු කොමිෂන් සභාවේ සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින අතරතුර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට නොකඩවා ගෙවනු ලැබිය යුතුය. තව ද, එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී කොමිෂන් සභාවේ අරමුදල්වලින් ඔහු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට ආණ්ඩුව යටත් වන දායක මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ උචිත ගිණුමට බැර කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට කොමිෂන් සභාව විසින් ඔහු සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතුය.

(3) යම් රජයේ නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලබන අවස්ථාවක—

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් අස්වූ ලෙස සලකනු ලැබිය යුතුය ;

(ආ) ඔහු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේදී රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් වූයේ නම්—

(i) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ දින රාජ්‍ය සේවයෙන්

ඔහු විශ්‍රාම ගන්වනු ලැබ තිබිණි නම් ඔහුට ගෙවිය ලැබිය හැකිව තිබූ ප්‍රදානයක් ලැබීමට, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට සුදුසුකම් තිබිය යුතු ය;

වයස නිසා හෝ අසනීපයක් නිසා හෝ ඔහු විසින් ඒ කාර්ය මණ්ඩලයෙහි දරන ලද තනතුර අහෝසි කිරීම නිසා හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවා නියුක්තිය විශ්‍රාම ගැන්වීමෙන් අවසන් කරනු ලැබුවහොත් මිස, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරන ලද එවැනි යම් ප්‍රදානයක මුදල් ප්‍රමාණය ඔහුට ගෙවිය නොලැබිය යුතුය; තවද

කොමිෂන් සභාවේ සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින අතරතුර, ඔහුගේ මරණය සිදුවූ විට කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙරාතුව ම ඔහුගේ මරණය සිදුවී නම්, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු සම්බන්ධයෙන් කළ හැකිව තිබූ යම් ප්‍රදානයක්, ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකිය; තවද

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකුව සිටියේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව, ගිවිසුම අවසන් වීමෙන් ආණ්ඩුවේ සේවය අත්හරිනු ලැබූ ලෙස, ඒ ආඥාපනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු, කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

15. කොමිෂන් සභාවේ සියලු ම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

16. කොමිෂන් සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

17. මේ පනත යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාරණා සම්බන්ධයෙන් වූ යම් වාර වාර්තා සහ තොරතුරු කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් අන්තර් කාල තුළ හා යම් ආකෘතියක කොමිෂන් සභාව වෙත සපයන ලෙස, කොමිෂන් සභාව විසින්, බලයලත් තැනැත්තකු ද ඇතුළුව යම් තැනැත්තකුට හෝ (බලයලත් තැනැත්තකු විසින් හෝ කොමිෂන් සභාව විසින් හෝ නිකුත් කරන ලද්දේ වුවද) මගී සේවා අවසර පත්‍රයක් දරන්නකුට නියම කරනු ලැබිය හැකි ය.

වාර වාර්තා.

## II වන කොටස

## බලයලත් තැනැත්තන්ට අදාළ බලතල

18. යම් බස්රථයක ලියාපදිංචි අයිතිකරු, රජය, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් වන්නේ නම් නැතහොත් රජය, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් කොටස් දරන යම් සංස්ථාවක් වන්නේ නම්, වෙන් වෙන් ගාස්තු සඳහා මගීන් ගෙන යාම පිණිස ඒ බස්රථය යොදා ගැනීමට බලය දෙමින් මේ පනත යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ හෝ කිසිම මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද යම් බස්රථයක ලියාපදිංචි අයිතිකරු ජනතාකරණය කරන ලද සමාගමක් වන්නේ ද, ඒ බස්රථය සම්බන්ධයෙන් මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමක් මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සීමා කිරීම.

19. (1) මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කරමින් නැතහොත් ප්‍රදානය කරන ලද මගී සේවා අවසර පත්‍රයක් අවලංගු කරමින් හෝ අත්හිටුවමින් හෝ බලයලත් තැනැත්තකු විසින් ගන්නා ලද තීරණයෙන් හෝ බලයලත් තැනැත්තකු විසින් යම් අවසර පත්‍රයක් ප්‍රදානය කරන ලද්දේ නැතහොත් ප්‍රදානය කිරීමට යෝජනා කරන ලද්දේ යම් කොන්දේසියකට යටත්ව ද, ඒ කොන්දේසියෙන් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තැනැත්තා වෙත බලයලත් තැනැත්තා විසින් ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දිනයේ සිට දින දහ හතරක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබිය හැකි ය.

අභියාචන.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද අභියාචනයක් මත කොමිෂන් සභාව විසින්—

(අ) අභියාචනයට ඉඩ දී, අභියාචනය කරන ලද්දේ යම් බලය ලත් තැනැත්තකුගේ තීරණයට විරුද්ධව ද ඒ බලයලත් තැනැත්තාට, ඒ මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස හෝ සංශෝධනය කරන ලෙස නැතහොත් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ හෝ නියමය නිෂ්ප්‍රභ කරන ලෙස විධාන කළ හැකි ය;

(ආ) අභියාචනය නිෂ්ප්‍රභ කළ හැකි ය.

(3) සෑම බලයලත් තැනැත්තෑ ම, (2) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම බලයලත් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ පැහැර හැරීම පිළිබඳව කොමිෂන් සභාව විසින්, වහාම ජනාධිපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍ර අවලංගු කිරීමට කොමිෂන් සභාව සතු බලය.

20. (1) බලයලත් තැනැත්තකු විසින් නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නා, ඒ අවසර පත්‍රය ප්‍රදානය කරන ලද්දේ යම් කොන්දේසිවලට යටත්වද ඒ කොන්දේසි කඩ කරමින් ක්‍රියාකර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, සිය මෙහෙයීමෙන් ම සහ ඒ අවසර පත්‍රය අවලංගු කරනු නොලැබිය යුත්තේ හෝ අත්හිටුවනු නොලැබිය යුත්තේ මක්නිසාද යන්න පිළිබඳව හේතු දැක්වීමේ අවස්ථාවක් ඒ අවසර පත්‍රය දරන්නාට ලබා දීමෙන් පසුව, යම් නිශ්චිත කාලය කට ඒ අවසර පත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ කරනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින්, ස්වකීය තීරණය, ඊට හේතු ද සමග අවසර පත්‍රය දරන්නාට දන්වනු ලැබිය යුතු අතර, ඒ අවසර පත්‍රය ප්‍රදානය කරන බලයලත් තැනැත්තා වෙත ඒ තීරණයේ පිටපතක් කොමිෂන් සභාව විසින් යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් අවලංගු කරමින් හෝ අත්හිටුවමින් කොමිෂන් සභාව විසින් කරන ලද තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව, ඒ තීරණය ඔහුට දැනුම් දෙනු ලැබූ දින සිට දින දහ හතරක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තමා වෙත කරන ලද අභියාචනයක් මත, ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දී, අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හෝ තීරණය නිෂ්ප්‍රභ කරන ලෙස කොමිෂන් සභාවට විධාන කළ හැකි ය; නැතහොත්

(ආ) අභියාචනය නිෂ්ප්‍රභ කොට, කොමිෂන් සභාවේ තීරණය ස්ථිර කිරීම කළ හැකි ය.

නිශ්චිත ප්‍රදේශය සම්බන්ධයෙන් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාව සතු බලය.

21. කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද හා තත් කාලයේ වලංගුව බලපවත්නා මගී සේවා අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් නියමිත දිනයේ සිට හා ඉන් පසුව, නිශ්චිත ප්‍රදේශය ඇතුළත වෙන් වෙන් ගාස්තු සඳහා මගීන් ගෙන යාම පිණිස බස්රථයක් පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

නිශ්චිත ප්‍රදේශයෙහි මගී සේවා අවසර පත්‍ර.

22. 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් මගින්, ඒ අවසර පත්‍රයට අනුයුක්ත කර ඇති කොන්දේසිවලට අනුකූලව, ඒ අවසර පත්‍රයෙහි දක්වා ඇති මාර්ගයෙහි හෝ මාර්ගවල මගින් ගෙන යාම පිණිස, තමා ලියා පදිංචි අයිතිකරු වන ඒ බස් රථය පාවිච්චි කිරීමට, අවසර පත්‍රය දරන්නාට හිමිකම තිබිය යුතු ය.

මගී සේවා අවසර පත්‍ර සඳහා ඉල්ලුම් කිරීම.

23. (1) 24 වන වගන්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් බස්රථයක් සම්බන්ධයෙන් ද, ඒ බස්රථයේ ලියා පදිංචි අයිතිකරු විසින්, කොමිෂන් සභාව වෙත නියම කරනු ලබන ආකෘතියෙහි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්කරුවකු විසින් ම, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන තම ඉල්ලුම් පත්‍රය සමග, පහත දැක්වෙන විස්තර ඇතුළත් ප්‍රකාශයක් නියම කරනු ලබන ආකෘතියෙහි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :—

(අ) වෙන් වෙන් ගාස්තු සඳහා මගීන් ගෙන යාම පිණිස ඒ බස්රථය පාවිච්චි කිරීමට යෝජනා කරනු ලබන මාර්ගය හෝ මාර්ග හෝ පිළිබඳ විස්තර ; සහ

(ආ) 24 වන වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන වෙනත් යම් විස්තර.

අවසර පත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම.

24. මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ඉල්ලුම් පත්‍රයෙහි ඉල්ලා ඇති මාර්ගයේ හෝ මාර්ගවල බස් රථ සේවා සඳහා මහ ජනතාවගේ ඉල්ලුම කෙරෙහි සැලකිලිමත් ව, කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ඒ අවසර පත්‍රය ප්‍රදානය කිරීමෙන් ඉල්ලා ඇති මාර්ගය සඳහා අවශ්‍ය ප්‍රමාණය ඉක්මවන බස්රථ සංඛ්‍යාවක් යෙදවීමේ ප්‍රතිඵලය ඇති වන බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම් අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමට ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

**මගී සේවා අවසර පත්‍ර වලංගුව බලපවත්නා කාලය හා ගාස්තුව.**

25. (1) නියම කරනු ලබන ගාස්තුව යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවට ගෙවීම මත හැර, 24 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඒ තැනැත්තාට මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(2) 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතියෙහි විය යුතුය ; තවද

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එක් අවුරුද්දකට නොඅඩු වූද අවුරුදු තුනකට නොවැඩි වූද ඒ අවසර පත්‍රයෙහි සඳහන් යම් කාලයක් සඳහා බලාත්මක විය යුතු ය.

**24 වන වගන්තිය යටතේ වූ අවසර පත්‍රවල අනුයුක්ත කළ යුතු කොන්දේසි.**

26. මහජනයාගේ ආරක්ෂාව සහ පහසුව සුරක්ෂිත කිරීම සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි සියලු කොන්දේසි 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයක ම අනුයුක්ත කරනු ලැබිය යුතු ය. ඒ කොන්දේසිවලට—

(අ) අවසර පත්‍රයෙහි අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස් රථය අවසර පත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති මාර්ගයෙහි හෝ මාර්ගවල, එහි නිශ්චිතව සඳහන් කාල සටහනට අනුකූලව ධාවනය කළ යුතු බවට;

(ආ) කාල සටහනෙහි සහ ගාස්තු චක්‍රයෙහි පිටපත්, අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස් රථයේ රැගෙන යායුතු බවට සහ එහි තුළ ප්‍රදර්ශනය වන ලෙස තැබිය යුතු බවට ;

(ඇ) අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස් රථය, සියලු අවස්ථාවන්හි දී සුදුසු හා සේවය කළ හැකි තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු බවට ;

(ඈ) බස්රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් හෝ අඛණ්ඩව කාර්යයෙහි නිරත වන කාලය සහ ඔවුන්ගේ වැඩ කරන හෝ විවේක කාලය සහ ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක නියමයක්, අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන බස් රථයේ රියැදුරු සහ කොන්දොස්තර සම්බන්ධයෙන් පිළිපදිනු ලැබිය යුතු බවට,

නියම කෙරෙන කොන්දේසි ඇතුළත් විය හැකි ය.

**අවසර දෙනු ලැබූ බස් රථයේ විස්තර අවසර පත්‍ර වල දැක්වීම.**

27. කොමිෂන් සභාව විසින්, 24 වන වගන්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවේදී, ඒ අවසර පත්‍රය මගින් පාවිච්චි කිරීම සඳහා බලය දෙනු ලබන බස් රථය, එහි හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන වෙනත් විස්තර ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන්, නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

අවසර පත පැවරිය නොහැකි බව.

28. 24 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත ප්‍රදානය කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක්, වෙනත් යම් තැනැත්තකුට පැවරිය නොහැකි විය යුතු අතර, ඒ අනුව, එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බල රහිත විය යුතු ය.

අවසර පත්‍ර දරන්නක් විසින් විස්තරවල යම් වෙනසක් පිළිබඳව කොමිෂන් සභාවට දැන් විය යුතු බව.

29. (1) 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින්, මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ස්වකීය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තරවල යම් වෙනසක් සිදුවී දින තිහක් ඇතුළත, ඒ වෙනස පිළිබඳව කොමිෂන් සභාව වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින්, ඒ අවසර පත්‍රය මගින් සැලසීමට ඔහුට බලය ලැබී ඇති බස් සේවය සැලසීමට දින තිහක අඛණ්ඩ කාලයක් තුළ පැහැර හැර හෝ නොසලකා හැර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, ඒ අවසර පත්‍ර දරන්නාට කරුණු දක්වා සිටීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු, ඒ අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකිය.

අවසර පත්‍රය අලුත් කිරීම.

30. (1) (2) වන උපවගන්තියට යටත්ව ද, 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද යම් මගී සේවා අවසර පත්‍රයකින් ආවරණය වූ මාර්ගයක හෝ මාර්ගවල ජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් බස්රථ සේවා තිබේද යන කරුණ පිළිබඳව සැළකිලිමත්ව ද, කොමිෂන් සභාව විසින්, ඒ අවසර පත්‍රය, එය දරන්නා විසින් කොමිෂන් සභාව වෙත කරනු ලබන ඉල්ලීමක් මත ඒ අවසර පත්‍රයේ කාලය ඉකුත් වන දිනයේ සිට ගණන් බලනු ලබන එක් අවුරුද්දකට නොඅඩු හා අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා අලුත් කළ හැකි ය.

(2) 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද යම් අවසර පත්‍රයක් දරන්නා—

(අ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ විධිවිධාන පිළිපැද නොමැති බව;

(ආ) මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ හෝ යම් වරදකට වරදකරු කර ඇති බව;

(ඇ) අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවා නොමැති බව,

කොමිෂන් සභාවට පෙනී යන්නේ නම්, කොමිෂන් සභාව විසින්, ඒ අවසර පත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

අවසර පත්‍රයක් අවලංගු කිරීම.

31. (1) 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද හෝ 30 වන වගන්තිය යටතේ අලුත් කරන ලද හෝ යම් මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින්—

(අ) මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ උල්ලංඝනය කර ඇති බවට;

(ආ) මේ පනත යටතේ ඔහු වෙත නිකුත් කරනු ලැබූ යම් විධාන යකට අනුකූලව ක්‍රියා කර නොමැති බවට ;

(ඇ) මේ පනත යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍ර යක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරක හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක, ඔහුගේ දැනුම අනුව ව්‍යාජ හෝ සාවද්‍ය වූ යම් විස්තර සපයා ඇති බවට ;

(ඈ) ඔහුගේ අවසර පත්‍රයට අනුයුක්ත කොන්දේසි කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත් වන්නේ නම්, කොමිෂන් සභාව විසින් ඒ මගී සේවා අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාවේ තීරණයට විරුද්ධව අභියාචනය කිරීමේ කාලය අවසන් වන තුරු හෝ අභියාචනයක් ඉදිරිපත් කර ඇත් නම් ඒ අභියාචනය පිළිබඳව සුදුස්සක් කරන තුරු, (1) වන උපවගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවිය යුතු ය.

කොමිෂන් සභාව විසින් එකී තීරණය සහ එයට හේතු ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍ර දරන්නාට හෝ දැනුම් දිය යුතු බව.

32. කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් මගී සේවා අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක, ස්වකීය තීරණය සහ ඒ සඳහා වූ හේතු කොමිෂන් සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට හෝ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අභියාචන.

33. (1) (අ) 24 වන වගන්තිය යටතේ මගී සේවා අවසර පත්‍ර යක් ප්‍රදානය කිරීම හෝ 30 වන වගන්තිය යටතේ එය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් හෝ ;

(ආ) 31 වන වගන්තිය යටතේ මගී සේවා අවසර පත්‍ර යක් අවලංගු කරමින් ; හෝ

(ඇ) අවසර පත්‍රයක් ප්‍රදානය කර ඇත්තේ හෝ ප්‍රදානය කිරීමට යෝජනා කර ඇත්තේ යම් කොන්දේසි වලට යටත්ව බව නියම කිරීමෙන් ද, එම නියම කිරීමෙන්

කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම්කරු හෝ මගී සේවා අවසර පත්‍රයක් දරන්නා හෝ විසින්, තමා වෙත ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින දහ හතරක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් අභියාචනයක දී ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දී, අභියාචනයට විෂය වූ මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස හෝ කොමිෂන් සභාවට විධාන කිරීම ; හෝ

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීම ; හෝ

(ඇ) අභියාචනය මත ඔහුගේ තීරණය අනුව අවසර පත්‍රය සංශෝධනය කරන ලෙසට හෝ අවසර පත්‍රය ප්‍රදානය කරන ලෙසට කොමිෂන් සභාවට විධාන කිරීම.

කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූලව කොමිෂන් සභාව ක්‍රියා කළ යුතු ය.

34. 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද සෑම මගී සේවා අවසර පත්‍රයක් දරන්නකු වෙතම ඒ අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන එක් එක් බස් රථය සම්බන්ධයෙන් සහතිකයක් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබිය යුතුය. ඒ අවසර පත්‍රය දරන්නා විසින් ඒ එක් එක් සහතිකය, ඒ සහතිකය අදාළ වන බස් රථයට ඇතුළු වන යම් තැනැත්තකුට පැහැදිලිව පෙනෙන ආකාරයෙන් ඒ බස් රථයේ වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය. සහතිකය වින් ඩ්ස් ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව.

## III වන කොටස

## මුදල්

35. (1) කොමිෂන් සභාවට කොමිෂන් සභාවේ ම අරමුදලක් තිබිය යුතු ය. කොමිෂන් සභාවේ අරමුදල.

(2) කොමිෂන් සභාවේ අරමුදල වෙත—

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන මුදල් ;

(ආ) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා හා කාර්ය කිරීමෙහි ලා කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා හා කාර්ය කිරීමෙහි ලා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් සහ කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ අරමුදල් වලින් ගෙවීමට මේ පනතින් නියමිත සියලු මුදල්, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ஆணைக்குழுவின் முடிபொன்றினால் இன்னலுறுபவரான அந்தப் பயணப் போக்குவரத்துச் சேவை அனுமதிப்பத்திரமொன்றுக்கான விண்ணப்பகாரர் அல்லது அனுமதிப்பத்திரமொன்றை வைத்திருப்பவர், எந்தத் தேதியன்று அவருக்கு அம்முடிபு அறிவிக்கப்பட்டதோ அந்தத் தேதியிலிருந்து பதினான்கு நாட்களுக்குள் அம்முடிபுக்கு எதிராக அமைச்சரின் அமைச்சுச் செயலாளருக்கு மேன்முறையீடு செய்யலாம்.

(2) செயலாளரானவர், (1) ஆம் உட்பிரிவின்கீழ் செய்யப்பட்ட மேன்முறையீடொன்றின்மீது—

(அ) மேன்முறையீட்டை அனுமதித்து, அத்துடன் மேன்முறையீடு எந்தப் பயணப் போக்குவரத்துச் சேவை அனுமதிப்பத்திரம் தொடர்பில் செய்யப்பட்டதோ அந்தப் பயணப் போக்குவரத்துச் சேவை அனுமதிப்பத்திரத்தை வழங்குமாறு அல்லது புதுப்பிக்குமாறு ஆணைக்குழுவுக்கு பணிப்பு வழங்கலாம்;

(ஆ) மேன்முறையீட்டை அனுமதிக்காதுவிடலாம்; அல்லது

(இ) அத்தகைய மேன்முறையீட்டின் மீதான அவரது முடிபுக்கிணங்க, அனுமதிப்பத்திரத்தைத் திருத்துமாறு அல்லது அனுமதிப்பத்திரத்தை வழங்குமாறு ஆணைக்குழுவைப் பணிக்கலாம்.

(3) ஆணைக்குழுவானது, (2) ஆம் உட்பிரிவின்கீழ் அதற்கு வழங்கப்பட்ட ஏதேனும் பணிப்புடன் இணங்கியொழுகுதல் வேண்டும்.

சான்றிதழானது வளித்தடுப்பு மீது வெளிக் காட்டி வைக் கப்படுதல்.

34. ஆணைக்குழுவானது 24 ஆம் பிரிவின் கீழ் வழங்கப்பட்ட ஒவ்வொரு பயணப்போக்குவரத்துச் சேவை அனுமதிப்பத்திரத்தின் அதிகாரத்தின் கீழ் பயன்படுத்தப்படும் ஒவ்வொரு வசுவண்டி தொடர்பிலும் அத்தகைய அனுமதிப்பத்திரத்தை வைத்திருப்பவருக்குச் சான்றிதழொன்றை வழங்குதல் வேண்டும். அனுமதிப்பத்திரத்தை வைத்திருப்பவர், அத்தகைய வசுவண்டியில் ஏறுகின்ற எவரேனும் ஆளுக்குத் தெளிவாகத் தெரியக்கூடியவாறான அத்தகைய முறையில் அத்தகைய ஒவ்வொரு சான்றிதழையும், அச்சான்றிதழ் எந்த வசுவண்டி தொடர்பிலானதோ அந்த வசுவண்டியின் வளித்தடுப்புமீது வெளிக்காட்டி வைக்கப்படச் செய்வித்தல் வேண்டும்.

## பாகம் III

### நிதி

ஆணைக்குழுவின் நிதியம்.

35. (1) ஆணைக்குழுவானது அதன் சொந்த நிதியத்தை வைத்திருத்தல் வேண்டும்.

(2) ஆணைக்குழுவின் நிதியத்துக்கு—

(அ) ஆணைக்குழுவின் பயன்பாட்டிற்கெனப் பாராளுமன்றத்தினால் காலத்திற்குக் காலம் வாக்களிக்கப்படக்கூடியவாறான அத்தகைய பணத்தொகைகள் யாவும்;

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

39. (1) මේ පනත යටතේ හෝ බලයලත් තැනැත්තකු විසින් හෝ මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද නැතහොත් එවැනි අවසර පත්‍රයක් අලුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා වෙත, මේ පනතේ විධිවිධානවලට හෝ එය යටතේ සාදනු ලැබූ නියෝගවලට හෝ ඒ අවසර පත්‍රයට අනුයුක්ත කරනු ලැබූ යම් කොන්දේසියකට හෝ අනුකූලව ඒ තැනැත්තා විසින් ක්‍රියා කරනු ලැබීමට සැලැස්වීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව අදහස් කරන විධාන, කොමිෂන් සභාව විසින් නිකුත් කළ හැකි අතර, ඒ විධානවල සඳහන් කරනු ලැබිය යුතු කාලය ඇතුළත ඒ විධාන අනුව ක්‍රියා කිරීම, එවැනි යම් විධාන නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

අවසර පත්‍ර දරන්නන්ට විධාන නිකුත් කිරීමට කොමිෂන් සභාව සතු බලය.

(2) කොමිෂන් සභාව විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කවර හෝ වේලාවක—

(අ) මගීන් ගෙන යාම සඳහා පාවිච්චි කරනු ලබන යම් බස් රථයක් පාවිච්චි කිරීම සඳහා මේ පනත යටතේ හෝ බලයලත් තැනැත්තකු විසින් හෝ ප්‍රදානය කරන ලද නැතහොත් අලුත් කරන ලද අවසර පත්‍රයකින් බලය ලැබී ඇත් ද යන වග හෝ ඒ අවසර පත්‍රයට අනුයුක්ත කොන්දේසි නැතහොත් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධාන අනුව ක්‍රියා කරනු ලබන්නේ ද යන වග හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන්නේ ද යන වග නිසැකව දැනගැනීම සඳහා ඒ බස් රථයට ඇතුළුවිය හැකි ය;

(ආ) 34 වන වගන්තිය යටතේ ඒ බස් රථය සම්බන්ධයෙන් නිකුත් කරන ලද සහතිකය හෝ ඒ බස් රථය වෙනුවෙන් ප්‍රදානය කරන ලද වෙනත් යම් ලේඛනයක් හෝ ඉදිරිපත් කරන ලෙස එම බස් රථයේ රියැදුරුට නියම කළ හැකි ය; නැතහොත්

(ඇ) ඒ සහතිකය හෝ වෙනත් ලේඛනය හෝ එහි පිටපත, තමන්ගේ භාරයට ගත හැකි ය.

40. (අ) තමන් වෙත කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති යම් විධානයකට හෝ කර ඇති යම් නියමයකට හෝ අනුව ක්‍රියා කිරීම පැහැර හරින;

වැරදි.

(ආ) කොමිෂන් සභාව විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් මේ පනතින් ඔහු වෙත පවරනු ලැබූ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේදී ඒ තැනැත්තාට විරෝධය දක්වන හෝ බාධා කරන;

(ඇ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබූ විට යම් වාර වාර්තාවක්, තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම නොකර සිටින හෝ ප්‍රතික්ෂේප කරන ;

(ඈ) අසත්‍ය හෝ සාවද්‍ය හෝ බව තමන් දන්නා තොරතුරු ඇතුළත් යම් වාර වාර්තාවක්, තොරතුරු හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් කොමිෂන් සභාවට සපයන ; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ උල්ලංඝනය කරමින් ක්‍රියා කරන

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතුය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි.

41. මේ පනත යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව, සාමාන්‍යාධිකාරි වරයකුව, ලේකම්වරයකුව හෝ ඊට සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තකු ම

වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අපසහායකත්වය නොමැතිව බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නිසි සියලු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.

42. (1) (අ) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට විරුද්ධව ; නැතහොත්

(ආ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය පිට හෝ කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව කරනු ලැබුවේ හෝ කරන ලදැයි කියනු ලබන්නේ සද්භාවයෙන් බව අධිකරණය තීරණය කරන්නේ නම්, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

බලයලත් තැනැත්තා විසින් කර්තව්‍ය ඉටු කිරීම පැහැර හැරීම.

43. බස් රථ මගින් මාර්ගවල මගී ප්‍රවාහනයට අදාළව, යම් ලිඛිත නීතියක් මගින් බලයලත් තැනැත්තකු වෙත පවරා ඇති යම් කර්තව්‍යයක් හෝ, මේ පනත යටතේ ඔහු වෙත නිකුත් කර ඇති විධානයක් හෝ ඉටු කිරීම, බලයලත් නිලධරයකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, කොමිෂන් සභාව විසින් එම පැහැර හැරීම පිළිබඳව, වහාම ජනාධිපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, එම කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුත්තේ යම් ප්‍රදේශයක් වෙනුවෙන් ද, ඒ ප්‍රදේශයෙහි බස් රථ සේවා අඛණ්ඩව සැලසෙන බවට සහතික වීම පිණිස කොමිෂන් සභාව විසින් සුදුසු පියවර ගනු ලැබිය හැකි ය.

නියෝග.

44. (1) නියමිත යයි මේ පනතින් නියම කරනු ලැබූ හෝ මේ පනතින් නියෝග සෑදීමට බලය දී ඇති හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් ද, විශේෂයෙන්ම, පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ද, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) මේ පනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රවල භාරය, ඒවා ඉදිරිපත් කිරීම හෝ ඒවා අවලංගු කළ විට, ඒවායේ කාලය ඉකුත් වූ විට හෝ අත්හිටුවනු ලැබූ විට හෝ ආපසු භාරදීම සහ සහතික පත්‍ර හා ලුවරුවල භාරය, ඒවා ඉදිරිපත් කිරීම සහ ආපසු දීම ;

(ආ) බස් රථවල රැගෙන යා යුතු පුවරු හා සළකුණු සහ ඒවා ප්‍රදර්ශනය කළ යුතු ආකාරය ;

(ඇ) ඒ අවසර පත්‍ර දරන්නන් විසින් බස් රථවල රියැදුරන් හෝ කොන්දොස්තරවරුන් හෝ වශයෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන් හා ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා අවසාන කරන වේලාවන් හා ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා ;

(ඈ) බස් රථවල රියැදුරන් විසින් රැගෙන යා යුතු ලේඛන හා ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර ;

(ඉ) බස් රථවල ගමන් සම්බන්ධයෙන් තබාගත යුතු වාර්තා ;

(ඊ) එසේ තබාගනු ලබන වාර්තා සුරක්ෂිතව තබා ගැනීම, කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම හා එසේ බලය දෙන ලද තැනැත්තා විසින් ඉල්ලා සිටි විට ඒ වාර්තා පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ජනතාකරණය කරන ලද සමාගම් ගණන් බේරා වසා ඇමීම.

45. 1982 අංක 17 දරන සමාගම් පනතේ කුමක් සඳහන්ව ඇත ද, යම් ජනතාකරණය කරන ලද සමාගමක් විසින් සැපයීමට බලය ලැබී ඇති බස් සේවා සැපයීම මාස තුනක හෝ ඊට වැඩි කාල යක් තුළ පැහැර හැර අත්නම්, කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීමක් මත, ඒ සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටියේ යම් දිසා අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ දිසා අධිකරණය විසින්, ඒ සමාගම ගණන් බේරා වසා දමන ලෙස නියම කරනු ලැබිය හැකි ය. 1982 අංක 17 දරන සමාගම පනතේ IX වන කොටසේ, අධිකරණය විසින් සමාගම්වල ගණන් බේරා වසා ඇමීමට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ගණන් බේරා වසා ඇමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මධ්‍යම ගමනාගමන මණ්ඩලයට සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට අදාළ විධිවිධාන.

46. (1) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩල යෙහි හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ එවැනි මණ්ඩලයක කිසියම් කොටසක හෝ කර්තව්‍ය භාර ගැනීම පිණිස සමාගමක් සංස්ථාගත කර ඇති බව ප්‍රකාශ කරමින්, නියමිත දින යෙන් පසුව නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද—

(අ) නියම කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පැවතියා වූ මණ්ඩලයේ සියලු බැරකම් හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධ වන තාක් දුරට වූ මණ්ඩලයේ සියලු බැරකම්, නියමයේ දිනයෙහි සිට රජය වෙත පැවරිය යුතු අතර, ඒවා රජයේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) නියම කරන ලද දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවැතියාවූ, නියමයෙහි සඳහන් මණ්ඩලය විසින් ඇතුළත් වුණු සියලු ගිවිසුම් හා එකඟවීම් හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධවන තාක් දුරට වූ මණ්ඩලයේ සියලු ගිවිසුම් හා එකඟවීම් නියමයේ දිනයෙහි සිට රජය විසින් ඇතුළත් වුණු ගිවිසුම් හා එකඟවීම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) නියමය කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයෙහි විනිශ්චයට භාජනව පැවැති, මණ්ඩලය විසින් පවරනු ලැබූ හෝ, එයට විරුද්ධව පවරා තිබුණු හෝ සියලු නඩු හෝ නඩු කටයුතු හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධ වන තාක් දුරට මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ පවරා තිබුණු සියලු නඩු හෝ නඩු කටයුතු රජය විසින් පවරනු ලැබූ හෝ රජයට විරුද්ධව පවරනු ලැබූ හෝ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, පවත්වා ගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය;

(ඈ) නියමය කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඉෂ්ට නොකර පවතින්නා වූ ද, මුදල් ගෙවීම හා සම්බන්ධව වූ ද, මණ්ඩලය විසින් හෝ එයට විරුද්ධව හෝ යම් අධිකරණයක නැතහොත් විනිශ්චයාධිකාරයක පවරන ලද යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධ වන තාක් දුරට මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ යම් අධිකරණයක නැතහොත් විනිශ්චයාධිකාරයක පවරන ලද යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී සටහන් කරන ලද නැතහොත් කරන ලද යම් තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් රජයේ වාසියට හෝ රජයට විරුද්ධව සටහන් කරන ලද නැතහොත් කරන ලද තීන්දු ප්‍රකාශයක් නැතහොත් ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එය ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි ය;

(ඉ) නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි මණ්ඩලයේ කාර්ය සඳහා හෝ නියමයේ සඳහන් කොටසේ කාර්ය සඳහා උපයෝගී කර ගන්නා ලද සියලු නිශ්චල දේපළ ඒ නියමයේ දිනයෙහි සිට රජය සතුවිය යුතු ය.

(2) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙහි හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ එවැනි මණ්ඩලයක කිසියම් කොටසක හෝ කර්තව්‍ය භාර ගැනීම පිණිස සමාගමක් සංස්ථාගත කර ඇති බව ප්‍රකාශ කරමින්, නියමිත දිනයට පෙර නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පනතේ පටහැනි ආකාරයක් සඳහන්ව ඇත ද—

(අ) නියමය කරන ලද දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවතියා වූ මණ්ඩලයේ සියලු බැරකම් හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධ වන තාක් දුරට වූ මණ්ඩලයේ සියලු බැරකම්, නියමයේ දිනයෙහි සිට රජය වෙත පැවරිය යුතු අතර රජය වෙත පවරනු ලැබ තිබුණාක් සේ සලකනු ලැබිය යුතු ය.

(ආ) නියමය කරන ලද දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවතියා වූ, නියමයෙහි සඳහන් මණ්ඩලය විසින් ඇතුළත් වුණු සියලු ගිවිසුම් හා එකඟවීම් හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධ වන තාක් දුරට වූ මණ්ඩලයේ සියලු

ගිවිසුම් හා එකඟවීම් නියමයේ දිනයෙහි සිට රජය විසින් ඇතුළත් වුණු ගිවිසුම් හා එකඟවීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) නියමය කරන ලද දිනයට පෙරාතුවම වූ දිනයෙහි විනිශ්චයට භාජනයව පැවති, මණ්ඩලය විසින් පවරනු ලැබූ හෝ එයට විරුද්ධව පවරා තිබුණු හෝ සියලු නඩු හෝ නඩු කටයුතු හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධ වන තාක් දුරට මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ පවරා තිබුණු සියලු නඩු හෝ නඩු කටයුතු රජය විසින් පවරනු ලැබූ හෝ රජයට විරුද්ධව පවරනු ලැබූ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව පවත්වා ගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය.

(ඈ) නියමය කරන ලද දිනයට පෙරාතුවම වූ දිනයෙහි ඉෂ්ට නොකර පවතින්නා වූ ද, මුදල් ගෙවීම හා සම්බන්ධ වූ ද, මණ්ඩලය විසින් හෝ එයට විරුද්ධව හෝ යම් අධිකරණයක නැතහොත් විනිශ්චයාධිකාරයක පවරන ලද යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී හෝ නියමයේ සඳහන් කොටසට සම්බන්ධ වන තාක් දුරට මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ යම් අධිකාරණයක නැතහොත් විනිශ්චයාධිකාරයක පවරන ලද යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී සටහන් කරන ලද නැතහොත් කරන ලද යම් තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් රජයේ වාසියට හෝ රජයට විරුද්ධව සටහන් කරන ලද නැතහොත් කරන ලද තීන්දු ප්‍රකාශයක් නැතහොත් ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එය ක්‍රියාවෙහි යොදවනු ලැබිය යුතු ය.

(ඉ) නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි මණ්ඩලයේ කාර්ය සඳහා හෝ නියමයේ සඳහන් කොටසේ කාර්ය සඳහා හෝ උපයෝගී කර ගන්නා ලද සියලු නිශ්චල දේපළ ඒ නියමයේ දිනයෙහි සිට රජය වෙත සතුවී ඇත්තාක් සේ සැලකිය යුතු ය.

(3) 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

මෝටර් වාහන පනත සංශෝධනය කිරීම.

47. මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකාරයට, මෝටර් වාහන පනත සංශෝධනය කරනු ලැබේ.

අන්තර් කාලීන විධිවිධාන.

48. නිශ්චිත ප්‍රදේශයක් ඇතුළත වූ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන්, 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනත යටතේ ප්‍රදානය කරනු ලැබූවා වූ ද, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයෙහි වලංගුව පවත්නා වූ ද, සෑම මගී සේවා අවසර පත්‍රයක් ම, පළමුව සඳහන් කරන ලද ප්‍රදේශය සම්බන්ධයෙන්, 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද මගී සේවා අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

49. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"බලයලත් තැනැත්තා" යන්නෙන් යම් මඟී සේවා අවසර පත්‍රයක් හෝ ඒ හා සමාන බලපත්‍රයක් අදාළ වන ප්‍රදේශය ඇතුළත වෙන් වෙන් ගාස්තු මත මඟීන් ගෙන යාම සඳහා බස් රථයක් පාවිච්චි කිරීමට බලය දෙන ඒ අවසර පත්‍රය හෝ ඒ හා සමාන බලපත්‍රයක් හෝ නිකුත් කිරීමට ලිඛිත නීතියෙන් බලය දී ඇති යම් තැනැත්තෙක් අදහස් වේ ;

"ද්විත්ව කාර්ය වාහනය" යන්නෙන් මඟීන් සහ භාණ්ඩ යන දෙවර්ගය ම ගෙන යාම සඳහා සැලසුම් කරන ලද වාහන යක් අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් ගමනාගමන විෂයය පවරනු ලැබ ඇත්තා වූ ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබ ඇත්තා වූ ද අමාත්‍යවරයා අදහස් වේ ;

"බස්රථය" යන්නෙන්, මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් අදහස් වන අතර, ඊට ද්විත්ව කාර්ය වාහනයක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය ;

"ජනතාකරණය කරන ලද සමාගම" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක කර්තව්‍ය හෝ කර්තව්‍යවලින් කොටසක් හෝ භාර ගැනීම සඳහා, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ පිහිටුවන ලද සමාගමක් අදහස් වේ ;

"වෙන් වෙන් ගාස්තුව" යන්නෙන් බස් රථයක මඟියකු වශයෙන් ගෙන යනු ලැබීමට යම් තැනැත්තකුට හිමිකම් ලබා දෙන, ඒ තැනැත්තා විසින් කරනු ලබන ගෙවීම අදහස් වේ ;

"නිශ්චිත ප්‍රදේශය" යන්නෙන් මඟීන් ගෙන යාම සඳහා බස් රථයක්, ප්‍රදේශය ඇතුළත පාවිච්චි කිරීමට බලය දෙන මඟී සේවා අවසර පත්‍රයක් හෝ වෙනත් බලපත්‍රයක් හෝ නිකුත් කිරීම සඳහා නියමිත දිනයේ දී ලිඛිත නීතියෙන් බලය පවරා ඇති තැනැත්තකු නොමැත්තේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද, එවැනි ප්‍රදේශයක් අදහස් වේ.

50. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

## උපලේඛනය

( 47 වන වගන්තිය)

### මෝටර් වාහන පනතට සංශෝධන

1. ඒ පනතේ 2 වන වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

2. ඒ පනතේ 4 වන වගන්තියේ—

(1) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ ප්‍රදානය කරන ලද මගී සේවා අවසර පත්‍රයක් ; හෝ"

(2) (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ ප්‍රදානය කරන ලද මගී සේවා අවසර පත්‍රයක් ; හෝ".

3. ඒ පනතේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ලියාපදිංචි අයිතිකරු 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ ප්‍රදානය කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නා වන්නේ යම් බස් රථයක ද, ඒ බස් රථය සඳහා හැර වෙනත් බස් රථයකට මේ කොටස යටතේ කිසිදු මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.".

4. ඒ පනතේ 30 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) 31 වන වගන්තිය යටතේ නියම කර ඇති බලපත්‍ර ගාස්තුව ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

5. ඒ පනතේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්.

6. ඒ පනතේ 46 වන වගන්තියේ සිට 51 වන වගන්තිය තෙක් වූ වගන්තිද (ඒ වගන්ති දෙක ද ඇතුළුව) 54, 57, 60, 61 සහ 64 වන වගන්තිද ඉවත් කිරීමෙන්.

7. ඒ පනතේ 75 වන වගන්තියේ "ගාස්තුවක් හෝ තක්සේරුයක් සඳහා" යන වචන යෙදෙන කවර හෝ විටෙක, ඒ වෙනුවට "වෙන් වෙන් ගාස්තු මත" යන වචන ආදේශ කිරීමෙන්.

8. ඒ පනතේ 182 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "පරීක්ෂකයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින්" යන වචන වෙනුවට "පරීක්ෂකයකු, පොලිස් නිලධරයකු හෝ ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් බලය දී ඇති නිලධරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

9. ඒ පනතේ 183 වන වගන්තියේ "පොලිස් නිලධරයකු විසින්" යන වචන වෙනුවට "පොලිස් නිලධරයකු හෝ ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් බලය දී ඇති නිලධරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

10. ඒ පනතේ 185 වන වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :—

"කොන්දොස්තර වරයකු බස් රථයේ ගමන් යන විට විධිවිධානය.

185. යම් මහා මාර්ගයක පාවිච්චි කරනු ලබන බස් රථයක කොන්දොස්තරවරයකු ගෙන යනු ලබන අවස්ථාවක, ඒ කොන්දොස්තරවරයා "කොන්දොස්තර" යන වචනය තම ඇඳුමෙහි යම් ප්‍රකටව පෙනෙන කොටසක පැහැදිලි ලෙස සලකුණු කොට තිබිය යුතුය; නැතහොත් "කොන්දොස්තර" යන වචනය දරන පැහැදිලි අකුරින් වූ ලෝහ ලාංඡනයක් ප්‍රකටව පෙනෙන තැනක පැළඳිය යුතු ය.".

11. ඒ පනතේ 189 වන වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) මේ වගන්තියෙහි ඇතුලත් කිසිවක්, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද අවසර පත්‍රයක බලය යටතේ බඩු සහ මගීන් ගෙනයාම සඳහා ද්විත්ව කාර්ය වාහනයක් ලෙස පාවිච්චි කරනු ලබන ලොරිය කට අදාළ නොවිය යුතුය.".

12. ඒ පනතේ 239 වන, 239අ සහ 239ආ වගන්ති ඉවත් කිරීමෙන් ;

13. ඒ පනතේ 240 වන වගන්තියෙහි—

(1) "මෝටර් වාහනය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුලත් කිරීමෙන් :—

'"ජාතික ගමනාගමන කොමිෂන් සභාව" යන්නෙන්, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාව අදහස් වේ.'.

(2) "බස් රථය" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"බස් රථය" යන්නෙන්, බස් රථයක් වශයෙන් ලියාපදිංචි කරන ලද මෝටර් කෝච් රථයක් අදහස් වන අතර, ඊට ද්විත්ව කාර්ය වාහන යක් ද ඇතුලත් වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.'.

(3) පිළිවෙලින් "ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය" සහ "ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය" යන යෙදුම්වල අර්ථ කථන ඉවත් කිරීමෙන්.